# ලේඛක සංසදයට වසර දෙකයි

නිව් සවුත් වේල්ස් ප්‍රාන්තයේ සංස්ථාපිත සිංහල සංස්කෘතික හමුවට අනුබද්ධව පිහිට වූ ලේඛක සංසදයට දැන් වසර දෙකක් සම්පූර්ණ වී ඇත.

දැනට වසර ගණනාවක සිටම ඕස්ට්‍රේලියාවේ විවිධ ප්‍රාන්තවල සිංහල සාහිත්‍ය කෙරෙහි විශාල උනන්දුවක් ඇති වී තිබේ. පසුගිය දස වසරක කාලය තුළ සිංහලෙන් නවකතා, කෙටිකතා හා කාව්‍ය සංග්‍රහ රාශියක්ම ඕස්ට්‍රේලියාව තුළ බිහි විය. ඕස්ට්‍රේලියාවේ බහු සංස්කෘතික සමාජය තුළ සිංහල උප සංස්කෘතියක් බිහි කිරීමටද මෙවන් සිංහල සාහිත්‍ය නිර්මාණ එළිදැක්වීම මහත් පිටුවහලක් වන බව නොරහසකි.





මෙරටදී සාහිත්‍ය නිර්මාණවල යෙදෙන සිංහලයන් ඒකරාශි කර ඔවුන්ගේ නිර්මාණ අගය කිරීමත්, නිර්මාණකරණය සඳහා ඔවුන් දිරි ගැන්වීමත්, සහාය දීමත් මූලික අරමුණු කරගෙන මෙවන් ලේඛක සංසදයක් ඇරඹීමට තීරණය කරන ලදී. ලිවීමට උනන්දුවක්, හැකියාවක් හා ආසාවක් පමණක් නොව පොත පත පරිශීලනයට කැමැත්තක් ඇති සාහිත්‍යකාමීන් ඒකරාශි කිරීමටත්, සාහිත්‍යකාමීන් එක් රැස්ව අදහස් හුවමාරු කරගැනීමටත් මෙම ලේඛක සංසදය නිසා අවකාශ ලැබිණ.

ලේඛක සංසදය අරඹා මාස කිහිපයකින්ම සිඩ්නි නගරාසන්නව වෙසෙන සිංහල කලාකරුවන්ගේ සහභාගිත්වයෙන් සංයුක්ත ගී තැටියක් එළිදැක්වීම විශේෂ සිදුවීමක් විය. 'රුවැත්තියේ' නම් වූ මෙම ගී තැටියට පද රචනය කර, තනු යොදා ගායනය කළවුන් අතර ලේඛක සංසදයේ සාමාජිකයන් විශාල පිරිසක් සිටීමද සිඩ්නි නුවර ශ්‍රී ලාංකිකයන්ගේ මහත් සතුටට හේතු විය.

සිඩ්නි නුවර ලේඛකයකු වන හේමාල් ජයවික්‍රම ගේ 'මනුලි' නවකතාව එළි දැක්වීමද ලේඛක සංසදයේ අනුග්‍රාහකත්වය යටතේ සිදු විය. සිඩ්නි නුවර වාසය කරන ආචාර්ය ඥාණතිලක හේවාගමගේ රචනා කළ 'ජීවන ගසේ අරටුව' කාව්‍ය සංග්‍රහය එළිදැක්වීමට ලේඛක සංසදයේ සාමාජිකයන්ගේ සහාය ලැබිණි.

සිංහල පොත පත කියවීමට රුචිකත්වයක් දක්වන අපේ පාඨකයන්ගේ මනදොල සපිරීම ගැනද ලේඛක සංසදයේ අවධානය යොමු විය. පසු ගිය අඩ සිය වසරක පමණ කාලයේදී ලියවුන සිංහල නවකතා සිය ගණනක් මෙරටට ගෙන්වා, ඉතාම අඩු මුදලකට විකිණීමට ලේඛක සංසදය පියවර ගත්තේ මේ අරමුණ පෙරදැරි කරගෙනය. ශ්‍රී ලංකාවෙන් පොත් ගෙන්වා අඩු මුදලකට විකිණීමේ ව්‍යාපෘතිවලට ලේඛක සංසදයේ ඉදිරි වැඩසටහන්වලදීද මූලික තැනක් හිමිවෙයි.

සාහිත්‍ය නිර්මාණකරණය පිළිබඳ උපදෙස් ලබා දීම පිණිස විද්වතුන්ගේ සහාය ලබාගෙන වැඩ මුළුවක් සංවිධානය කිරීමට ලේඛක සංසදයේ ඉදිරි වැඩ සටහනට ඇතුළත් වේ.

පොත පත පරිශීලනයටත්, ලිවීමටත් ආසාවක් දක්වන හැමටම ලේඛක සංසදයේ සාමාජිකත්වය විවෘත වී ඇත.

ආචාර්ය පාලිත ගණේවත්ත
සිඩ්නි

---

නව වන පිටෙන්

කාර්යාලෙට යනකොට දොර ළඟ ඉන්නවා කොණ්ඩේ අන්තිම කොටට කපපු ඉරුණු ෂර්ට් එකකුයි පරණ ඩෙනිම් කලිසමකුයි ඇඳගත්ත හාදයෙක්. සර් දැන්වත් මම අර චරිතය කරන්න ගැලපෙනවද කියලා මිනිහා මගෙන් ඇහුවා. බලනකොට මේ ඊයේ ආව අර ඉලංදාරියා. බෙල්ල ළඟට වවලා තිබුණ අර ලස්සන ක්රේල් කොණ්ඩේ සම්පූර්ණයෙන්ම කපලා. පෙනුම සම්පූර්ණයෙන්ම වෙනස් කරගෙන. මට මේ මිනිහගේ කැපකිරීම ගැන හරි පුදුම හිතුනා. මේ වගේ කෙනෙක් ක්ෂේත්‍රයේ දිග ගමනක් යයි කියලා හිතුනා. ඒත් ඉතිං අර චරිතයට නම් මේ වගේ කඩවසම් කෙනෙක් හරි යන්නේ නෑ. ඒත් මෙයාගේ කැපවීම ගැන කල්පනා කරලා මම ඒ චිත්‍රපටියේ වෙනත් චරිතයක් කරන්න කියලා දුන්නා. ඇත්තෙන්ම ඒක බොහොම හොදට කළා. එහෙම තමයි විජය සිනමාවට ආවේ. ඇත්තටම විජයට සිනමාව ගැන හොද උනන්දුවක් කැපවීමක් වගේම රඟපෑමේ දක්ෂකමකුත් තිබුණා. ඒත් පස්සේ කාලේ එයා වානිජ චිත්‍රපටිවල සරල චරිත නිරූපනය පැත්තට බර වුණ නිසා ඔහුගේ දක්ෂතාවෙන් නියම ප්‍රයෝජනයක් ලබාගන්න බැරිවුණා. මම හිතන්නේ පසු කාලයේ ඔහුට හම්බ වෙච්ච අධ්‍යක්ෂවරුන්ට ඔහුගේ දක්ෂතා මතුකර ගන්න බැරිවුණා. යම් තරමකට හරි විජයට ඒ අවස්ථාව ලැබිලා තිබුණේ වසන්ත ඔබේසේකරගේ කැඩපතක ඡායා චිත්‍රපටියෙදි විතරයි.

**මාලිනී ෆොන්සේකාව සිනමාවට ගේන්නෙත් ඔබ. මාලිනීව කොහොමද හොයාගත්තේ ?**

මාලිනීගේ අම්මට තමයි ලොකු උවමනාවක් තිබ්බේ මාලිනීව නිලියක් කරන්න. මගේ අක්ක කෙනෙක් ඒ කාලේ හිටියා කැලණියේ. මාලිනීලගේ ගෙවල් තිබුණොත් ඒ කිට්ටුව. ඉතිං මම අක්කල ගෙදර ගිය වෙලාවක මාලිනීගේ අම්ම ඇවිල්ලා මම කරන්න යන චිත්‍රපටියේ මාලිනීට ඇක්ට් කරන්න දෙන්න කියලා ඉල්ලුවා. ඒ වෙනකොට මම දහසක් සිතුවිලි චිත්‍රපටියට නිලියක් හොය හොයා ඉන්න කාලේ. ඒකේ කතාව ගොඩනැගිලා තිබුණේ ගමෙන් නගරයට ඇවිල්ලා බොහොම ඉක්මනින් නාගරික ජීවිතයට හුරුවෙලා වෙනස්වෙන ගැමි තරුණියක් මුල් කරගෙන. මාලිනීව ගෙන්නගෙන බැලුවම එයා මේ චරිතයට ළපටි වැඩි බවක් තමයි මූනෙන් පෙනුනේ. අනික ඒ දවස්වල මාලිනීට ඉංග්‍රීසි කතා කරන්න බෑ. චිත්‍රපටියේ එන චරිතයට හොදට ඉංග්‍රීසි කතාකරන්න පුළුවන් වෙන්න ඕනේ. ඒ නිසා ඒ චරිතය වෙනුවට මාලිනීට වෙනත් චරිතයක් දෙන්න මම තීරණය කළා.

**ඔබගේ පවුලේ තොරතුරු ටිකක් දැනගන්නත් සන්නස පාඨකයන් කැමතිවෙයි ?**

මම අපේ පවුලේ බාලම පිරිමි දරුවා. වැඩිමලා අයියා. ඊළගට අක්කලා තුන්දෙනයි. මගේ විවාහය සිද්ධ වුණේ එංගලන්තේ ඉදලා නිවාඩුවකට ලංකාවට ඇවිල්ලා යන්න ආව වෙලාවක. ඒ 71 අවුරුද්දේ. ජේවීපී කලබල නිසා මෙහාට ප්ලේන් එන්නේ නැතුව මට මාස ගානක් ලංකාවේ හිරවෙලා ඉන්න සිද්ධවුණා. ඔය අතරේ ගෙදරින් විවාහ යෝජනාවක් ගෙනාවා. එයා ගීතාංජලී කල්‍යානි පිලපිටිය. ගම මහනුවර. බදිනකොට එයා විශ්ව විද්‍යාලේ ලෙක්චරර් කෙනෙක්. බැදලා මම එංගලන්තෙට ගහිල්ලා මාස තුනකින් එයාවත් ගෙන්න ගත්තා. එයාට එහෙ පුස්ථකාලාධිපති රස්සාවක් ලැබුණා. 72 අපිට දුවක් ලැබුණා. සජිනි වාසනා. එයා දැනටත් එංගලන්තේ ඉන්නේ.

ශ්‍රීලාල් සෙනෙවිරත්න
Srilal333@gmail.com

■

Tomorrows Migration Solutions Today...

FAIRFIELDS
IMMIGRATION LAWYERS - MELBOURNE

Our team of Specialist Lawyers, Lawyers & Barristers in Melbourne competently assisted many Sri Lankans, many other nationalities and many Australian Companies in the following areas of Migration matters over the years and continue to do so:

- General Skill Migration Permanent Resident visas
- General Skill Migration Provisional Resident visas
- Second stage Skilled Regional (Permanent residence) visas
- Graduate Skill Temporary visas
- Complex Student visas
- 457 Visas
- Employer Nominations (ENS)
- Employer Contracts
- Negotiations of employer nominations with the Australian Employers
- Regional Sponsored Migration Scheme (RSMS)
- Skill Assessments
- State Sponsorships
- TRA cancellations
- Criminal Prosecutions on TRA cancellations
- Student Visa Cancellations
- Permanent residence Cancelations
- Appeals to the Migration Review Tribunal (MRT) or Administrative Tribunal (AAT)
- Business Migration State Sponsorships
- First and Second Stage Business Migration visas
- Spouse & visas
- Aged Parent visas
- Aged Dependent Parent visas
- Contributory Parent visas
- Resident Return visas
- Australian Citizenships

*Our Team of Lawyers:*

**Don Susantha Katugampala** LL B (Monash)
MARN: 9801070
Accredited Immigration Law Specialist
Principal Lawyer – Fairfields Lawyers

**Michael Gros** LL B (Monash)
MARN: 9803398
Consulting Barrister

**Frank Sabelberg** LL B (Monash)
MARN: 0004726
Consulting Solicitor

FAIRFIELDS
IMMIGRATION LAWYERS - MELBOURNE

10 Morrison Place East Melbourne VIC 3002
T | 03 9650 4557 F | 03 9650 4559
info@fairfieldslawyers@com.au

*We Deliver Results...*